**බර්ටි ඩයස් වීරසිංහ එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ **1647/2019** (**2020.02.05** දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** බර්ටි ඩයස් වීරසිංහ
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**පෙනීසිටීම**
අභියාචක - බර්ටි ඩයස් වීරසිංහ
පොදු අධිකාරිය - නොපැමිණි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.03.06 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම - නැත<br>තීරණය ලබා දුන් දිනය - ලබා දී නොමැත |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.04.11 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳ අභියාචනය ලද බව දැන්වීම - නැත<br>තීරණය ලබා දුන් දිනය - ලබා දී නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.06.20 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.03.06 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*"2015-2016 අධ්‍යන වර්ෂයට අදාළව පහත සඳහන් තොරතුරු*

*2015-2016 අධ්‍යන වර්ෂය සඳහා විශ්ව විද්‍යාලවලට අන්ධ හා කායික අශනුක්තාවයක් ඇතිව බඳවා ගත් සිසු සිසුවියන් පිළිබඳව පහත තොරතුරු*

1. *එක් එක් විශ්ව විද්‍යාලය සඳහා බඳවා ගත් සිසුන්ගේ නාම ලේඛනය වෙන් වෙන්ව තොරතුරු සඳහන් කර*
2. *එම සිසු සිසුවියන් ලබා ගත් Z අගයන් වෙන් වෙන්ව*
3. *ඔවුන් බඳවා ගත් පාඨමාලා වෙන් වෙන්ව*
4. *එම සිසු සිසුවියන්ගෙන් මේ වන විට පාඨමාලා හැර ගොස් ඇති සිසුන් පිළිබඳ තොරතුරු"*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.04.11 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.06.20 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

2019.07.31 හා 2020.01.21 දිනැති ලිපි මගින් පොදු අධිකාරිය කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ අභියාචක වෙත 2019.07.30 දිනැති ලිපියෙන් තොරතුරු ලබා දුන් බව ය. 2019.07.30 දිනැති ලිපියේ අන්තර්ගතය පහත පරිදි වේ.

*"1.2015/2016 අධ්‍යන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා එක එක විශ්ව විද්‍යාලවලට බඳවාගත් අන්ධ හා කායික අශක්නුතාවයන් සහිත සිසුන් යනු විවිධ රෝගාබාධවලට ලක් වූ සිසුන් වන බැවින් ඔවුන්ගේ තොරතුරු ලබා දීමට තොරතුරු ලබා දීමේ පනතෙහි 5 වන වගන්තියෙහි 1 වැනි උප වගන්තියෙහි (ඉ) ඡේදය අනුව හැකියාවක් නැත.*

*2. සිසුන් ලබාගත් Z අගයන් ( Z score) විභාග දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දුන් තොරතුරු වන අතර පනතෙහි 5 වන වගන්තියෙහි 1 වැනි උප වගන්තියෙහි (ඕ) ඡේදය අනුව හැකියාවක් නැත.*

*3. අන්ධ හා කායික අශක්නුතාවයන් සහිත සිසුන් බඳවා ගනු ලබන්නේ කළා, වානිජ්‍ය, ජෛවීය හා භෞතීය විද්‍යාව පාඨමාලා සඳහා වේ.*

*4. පාඨමාලාවන් හැර ගොස් සිටින සිසුන්ගේ තොරතුරු එක් එක් විශ්වවිද්‍යාලවලින් දැනගත යුතු වේ."*

අභියාචක විසින් පවසා සිටියේ 2019.07.30 දිනැති ලිපියෙන් පොදු අධිකාරිය තොරතුරු අයිතම 2 හා 3 සම්බන්ධ තොරතුරු හෙළිදරවු කිරීම පනතේ 5 (1) (ඉ) හා (ඕ) යටතේ පිලිවෙලින් ප්‍රතික්ෂේප කල බව ය. තොරතුරු අයිතම 3 ට පිළිතුරු සැපයූ බව දන්වන ලදී. මෙහිදී අභියාචක විසින් තොරතුරු අයිතම 1 යටතේ ඉල්ලුම් කල ඇති සිසුන්ගේ නාම ලේඛනය ලබාදීම ඔවුන්ගේ පුද්ගලික තොරතුරු සැපයීමක් බව

වටහාගෙන ඒ වෙනුවට එක් එක් කාණ්ඩ සඳහා කොපමණ සංඛ්‍යාවක සිසුන් ප්‍රමාණයක් බඳවා ගත්තේද යන්න දැනගැනීමට කැමති බව දන්වන ලදී.

**නියෝගය:**

පොදු අධිකාරිය නොපැමිණි බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ. තවද තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරයා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව පොදු අධිකාරියකි. එම නිසා එහි විධිවිධාන අනුව කටයුතු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිත වගකීමක් ඇති බව පොදු අධිකාරියට අවධාරණය කරනු ලැබේ.

අභියාචක විසින් ලබා දුන් තොරතුරු නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අභියාචක විසින් තොරතුරු අයිතම 1 යටතේ ඉල්ලුම් කල ඇති සිසුන්ගේ නාම ලේඛන තුන්වන පාර්ශවයකගේ පෞද්ගලික තොරතුරු වන බව අභියාචක වෙත අවධාරණය කරනු ලැබේ. කෙසේ නමුත් අභියාචක විසින් මෙම තොරතුරු **සංඛ්‍යාලේඛන ලෙස (එනම් සිසුන් ලැයිස්තුව වෙනුවට, ඇතුළත් කරගත් සිසුන් අතුරින් වැඩිම සහ අවම Z අගයන් ලබාගත් ශිෂ්‍යා/ශිෂ්‍යාවගේ Z අගය, සහ එම පරාසය තුළ ඇතුළත් කරගත් සිසුන් සංඛ්‍යාව)** ලබාගැනීමට කැමැත්ත දැක්වීම මත අදාල තොරතුරු කාණ්ඩ කොට ඒ එක් ඒක් කාණ්ඩ සඳහා කොපමණ සිසුන් ප්‍රමාණයක් අයත් වේ ද යන්න දක්වා එම තොරතුරු අභියාචක වෙත ලබා දෙන මෙන් පොදු අධිකාරිය වෙත මින් නියෝග කෙරේ. තව ද මෙම කාණ්ඩ කිරීමේදී "වෙනත්" ලෙස කාණ්ඩයක් ඇතුලත් කල හැකි බව ද පොදු අධිකාරිය වෙත සැල කල සිටි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5 (1) (ඕ) උප වගන්තිය යටතේ තොරතුරු අයිතම 2 ට අදාල තොරතුරු අභියාචක වෙත ලබාදීම පොදු අධිකාරිය විසින් 2019.07.30 දිනැති ලිපියෙන් ප්‍රතික්ෂේප කල ඇති බව, කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලබන අතර ඉහත වගන්තිය පහත පරිදි වේ. *තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5 (1) වන වගන්තියේ (ඕ) උප වගන්තිය වෙත දෙපාර්ශවයේම අවධානය යොමු කරනු ලැබේ.*

> *"(2) වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව-…විභාග දෙපාර්තමේන්තුව හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පවත්වනු ලබන යම් විභාගයක් පිළිබඳ තොරතුරු රහසිගතව තබාගැනීමට නියමිත වන්න වූ අවස්ථාවකදී; මේ පනත යටතේ ඒ තොරතුරු වලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කල හැකිය."*

ඒ අනුව මෙම ව්‍යතිරේකය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කල හැක්කේ ඉහත ආයතන මගින් පවත්වන ලබන යම් විභාගයක් පිළිබඳ තොරතුරු "***රහසිගතව තබාගැනීමට***" අවශ්‍ය අවස්ථාවකදී බැවින්, මෙම තත්වයන් යටතේ අදාල තොරතුරු (තොරතුරු අයිතම 2) 5 (1) වගන්තියේ (ඕ) ව්‍යතිරේකයට අදාළ වන ආකාරය පැහැදිලි කරන මෙන් පොදු අධිකාරිය වෙත කොමිෂන් සභාව විසින් නියෝග කරනු ලැබේ. තව ද මෙහි දී එම සිසු සිසුවියන් ලබා ගත් Z අගයන් සම්බන්ධ තොරතුරු ලබා දීමේ දී ඔවුන්ගේ අනන්‍යතාවය හෙළි නොකිරීම සඳහා පහල සිට ඉහල පරාසයන් ලෙස දැක්විය හැකි බව පොදු අධිකාරිය වෙත නැවත අවධාරණය කරනු ලැබේ.

තොරතුරු අයිතම 3 හා සම්බන්ධ තොරතුරු 2019.07.30 දිනැති ලිපියෙන් ලබා දී ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

තොරතුරු අයිතම 4 යටතේ ඉල්ලුම් කල ඇති තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 (1) වගන්තිය ප්‍රකාරව, පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තිබේද යන්න පැහැදිලි කරන මෙන් පොදු අධිකාරිය වෙත නියෝග කරනු ලැබේ.

අභියාචනය 2020.04.21 ප.ව 01.15 ට කල් තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
*****